# ලංසු සඳහා ආරාධනයයි!
# දකුණු පළාත් මාර්ගස්ථ මගී ප්‍රවාහන අධිකාරිය

SPRPTA

## විශේෂ හා සුඛෝපභෝගී සේවා වාර්ෂික මගී ප්‍රවාහන බලපත්‍රයක් නිකුත් කිරීම(සීමිත)

### 752/AC ඇල්පිටිය - ගාල්ල - කරාපිටිය

මගී ඉල්ලුම හා රටේ සංවර්ධන අවශ්‍යතා අනුව අධිකාරිය විසින් හඳුනාගත් මාර්ග සඳහා වාර්ෂිකව ලංසු මුදල ගෙවීමේ පදනම යටතේ නව සුඛෝපභෝගී බස් සේවා මගී ප්‍රවාහන බලපත්‍රයක් නිකුත් කිරීමට, යෝග්‍යතා පූර්ණ සුදුසුකම්ලත් සීමිත ලංසුකරුවන්ගෙන්, මුද්‍රා තබන ලද ලංසු කැඳවනු ලැබේ. විශේෂ හා සුඛෝපභෝගී සේවාව වාර්ෂික මගී ප්‍රවාහන බලපත්‍ර සඳහා ලංසු පිරිනැමීමේ අයිතිය අධිකාරියේ ප්‍රසම්පාදන කමිටුව සතුය. මෙම බලපත්‍රය වාර්ෂික බලපත්‍රයක් ලෙස නිකුත් කරනු ලබන බැවින් සෑම වර්ෂයක් අවසානයේදීම බලපත්‍රය ලබා ගැනීමට ඔබ විසින් ඉදිරිපත් කරනු ලබන ලංසු මුදල ගෙවා වාර්ෂිකව බලපත්‍රය ලබා ගතයුතු වේ. ලංසු සඳහා ආරාධනා කරනු ලබන මාර්ගය පහත පලකරනු ලබන අතර, අදාල බස් සේවාව සඳහා පහත ලේඛනයේ සඳහන් අනුමත ආසන ධාරිතාවයෙන් යුතු බස්රථයක් ඉදිරිපත් කල යුතුය.

- ඇල්පිටිය බස් නැවතුම්පොළෙන් පමණක් ධාවනය සඳහා කාලසටහන් සහිත බලපත්‍රධාරීන්ට හා පොරොත්තු බලපත්‍රධාරින්ට ලංසු ආරාධනා ඉල්ලුම් කිරීමට අවස්ථාව ලබා දෙන අතර කාලසටහන් සහිත බලපත්‍රධාරින් සුදුසුකම් සපුරාලීම නොකලහොත් පමණක් පොරොත්තු බලපත්‍රධාරින් අතරින් සුදුස්සකු තෝරා ගනු ලැබේ.
- ලංසු සඳහා ආරාධනය කරනු ලබන මාර්ගය වෙනුවෙන්ම නියමිත කාලසටහන් හා ගාස්තු සටහන් සකස් කර ඇති අතර ලංසු ලේඛනය තුල අයදුම්පත්‍ර සමඟ කාලසටහන් හා ගාස්තු සටහන් විස්තර ලබා දෙනු ලැබේ.

ලංසු තැබීම මගින් ලබාදෙනු ලබන මාර්ගයේ ගමනාන්ත, අනෙකුත් බස් සේවාවන්ට වන බලපෑම හා නීතිමය කරුණු මත දීර්ඝ කිරීමක් හෝ වෙනත් මාර්ග සඳහා සංශෝධනය කිරීමක් ඉල්ලා සිටීමට හිමිකමක් නොමැත. ඒ ඒ අන්තයෙන් තවත් සුඛෝපභෝගී බස්රථ සංඛ්‍යාව වැඩි වුවහොත් කාලසටහන් කාර්ය චක්‍ර ගත කිරීමට අධිකාරියට බලය ඇත. මෙම මාර්ගවල මගී අවශ්‍යතාවය මත බස් සේවා තර කිරීමේදී ශ්‍රී ලංගම සමග (60%-40%) පදනම මත අනාගතයේ බස් සේවා තර කිරීම සිදු කෙරේ. ඒ අනුව මාර්ගය පරික්ෂා කර, ඉහත තත්ත්වයන් සලකා බලා බස් සේවා පවත්වාගෙන යාමේ හැකියාව සැලකිල්ලට ගෙන ලංසු වටිනාකම් ඉදිරිපත් කරන ලෙස දැනුම් දෙමි. මගී සේවාව පිළිබඳ අවබෝධයකින් තොරව බලපත්‍රය ලබා ගැනීම සඳහා ඉහල මිල ගණන් ඉදිරිපත් කොට ඒ මත පසුව අභියාචනා කිරීමේ අයිතියක් ඉල්ලුම්කරුට නොපවතී.

ටෙන්ඩර් හිමිකම ලබාගැනීමෙන් පසු, දින 60 ක කාලය ඇතුලත බලපත්‍රය ලබාගෙන බස් සේවාවක් ආරම්භ කල යුතු අතර, නියමිත දිනට හෝ ඊට පෙර බස් සේවාව ආරම්භ කිරීමට අපොහොසත් වන්නේ නම් තවදුරටත් අධිකාරියේ බලපත්‍ර සඳහා ලංසු තැබීමට නුසුදුස්සකුසේ සලකා අසාධු ලේඛන ගත කිරීමට සහ දැනට හිමිකම් ලබන නව බලපත්‍රය වෙනුවෙන් අත්හරිනු ලබන සාමාන්‍ය සේවා බලපත්‍රය අවලංගු කිරීමට කටයුතු කරනු ලැබේ.

ලංසු ආරාධනාවට අදාල උපදෙස්, නියමයන් හා කොන්දේසි අයදුම්පත්‍රය සමග ඉදිරිපත් කරන බැවින් ඒ පිළිබඳ අවබෝධයකින් යුතුව ලංසුකරු ලංසු අයදුම්පත්‍ර ඉදිරිපත් කල යුතුය.

## ලංසු තැබීම සඳහා ඉදිරිපත් කරනු ලබන මාර්ගයේ විස්තර

| විශේෂ හා සුඛෝපභෝගී සේවා වාර්ෂික මගී ප්‍රවාහන බලපත්‍ර | | | |
|---|---|---|---|
| විශේෂ හා ලංසු යොමු අංකය | මාර්ග අංකය | සේවාව | අනුමත ආසන ධාරිතාවය |
| OPR/FI/15/2026/05 | 752/AC | ඇල්පිටිය - ගාල්ල - කරාපිටිය | 29 හෝ ඊට වැඩි |

1. අභිලාශී ලංසුකරුවන්ට සිංහල භාෂාවෙන් සකස් කරන ලද අංග සම්පූර්ණ ලංසු ලිපි ලේඛන කට්ටලයක් ඉහත දක්වා ඇති එක් එක් ලංසු ආරාධනාවන්හි වෙන් වෙන් වශයෙන් සඳහන් ලංසු සඳහා ආපසු ගෙවනු නොලබන රුපියල් දහසක (රු.1,000/- ක) අයදුම්පත්‍ර ගාස්තුවක් මුදලින් ගෙවීමෙන් අනතුරුව 2026/08/03 වන දින සිට 2026/08/19 දින දක්වා කාර්යාල දිනයන් තුල පෙ.ව. 08.30 සිට ප.ව 03.00 දක්වා ද, 2026/08/20 දින පෙ.ව. 8.30 සිට 12.00 දක්වා ගාල්ල බස් නැවතුම්පොල උඩු මහලේ ඇති දකුණු පළාත් මාර්ගස්ථ මගී ප්‍රවාහන අධිකාරියේ ගාල්ල දිස්ත්‍රික් කාර්යාලයෙන්ද, ගාල්ල, කොටුව, ලේන්බාන්වීදිය, නො.67 හි පිහිටි දකුණු පළාත් මාර්ගස්ථ මගී ප්‍රවාහන අධිකාරියේ ප්‍රධාන කාර්යාලයෙන් අයදුම් පත්‍ර ලබා ගත හැක.

2. පූර්ව ලංසු රැස්වීමක් 2026/08/10 දින පෙ.ව 11.00 දකුණු පළාත් මාර්ගස්ථ මගී ප්‍රවාහන අධිකාරියේ ප්‍රධාන කාර්යාලයේදී පැවැත්වේ. (ලංසු තැබීමට අපේක්ෂා කරන අයට තවදුරටත් පැහැදිලි කර ගැනීම සඳහා)

3. අභිලාශී යෝග්‍යතා පූර්ණ හා සුදුසුකම්ලත් ලංසුකරුවන් හට වැඩිදුර තොරතුරු හා ලංසු ලිපි ලේඛන කාර්යාල වේලාව තුල අධිකාරියේ ප්‍රධාන කාර්යාලයේදී නොමිලේ පරීක්ෂා කිරීම සිදු කල හැකිය.

4. **2026/08/20** වන දින ප.ව **02.00** ට ලංසු භාර ගැනීම අවසන් කරන අතර ඉන් අනතුරුව ලංසු විවෘත කරනු ලැබේ.

5. නිසි පරිදි සම්පූර්ණ කර, මුද්‍රා තබන ලද ලංසු අයදුම්පත් "අනුපිටපතකින්" යුක්තව ලියාපදිංචි තැපෑලෙන් ගාල්ල, කොටුව, ලේන්බාන් විදිය, නො.67හි පිහිටි දකුණු පළාත් මාර්ගස්ථ මගී ප්‍රවාහන අධිකාරියේ ප්‍රසම්පාදන කමිටුවේ සභාපති වෙත ලැබෙන සේ යොමු කිරීම හෝ අධිකාරියේ තබා ඇති ටෙන්ඩර් පෙට්ටියට බහාලීම ලංසු ලබා ගන්නා අවසන් වේලාවට හෝ ඊට පෙර සිදු කල යුතුය. ප්‍රමාද වී ලැබෙන ලංසු අයදුම්පත් භාරගනු නොලැබේ. අයදුම්පත් බහාලන කවරයේ වම්පස ඉහළ කෙලවරේ **"752/AC** විශේෂ හා සුඛෝපභෝගී බස් සේවා වාර්ෂික බලපත්‍ර **-2026"** ලෙසද සඳහන් කල යුතුය.

6. ලංසු විවෘත කරන අවස්ථාවට ලංසුකරු හෝ ඔහුගේ බලයලත් ලංසු පිළිබඳ දැනුවත් නියෝජිතයා අනිවාර්යයෙන්ම සහභාගී විය යුතු බව දැනුම් දෙමි. මෙම නියෝගය කඩ කරනු ලබන අයදුම්කරුවන්ගේ ලංසු අයදුම්පත විවෘත කරනු නොලැබේ. ඕනෑම ලංසුවක් පිලිගැනීම හෝ ප්‍රතික්ෂේප කිරීම අධිකාරියේ ප්‍රසම්පාදන කමිටුව සතු වේ.

මුලික තොරතුරු දකුණු පළාත් මාර්ගස්ථ මගී ප්‍රවාහන අධිකාරියේ ගාල්ල දිස්ත්‍රික් කාර්යාලයෙන් හෝ අංක : 67, ලේන්බාන් විදිය, කොටුව, ගාල්ල ලිපිනයෙන් හෝ www.sprpta.lk වෙබ් අඩවියෙන් හා දුරකථන අංක **091- 2234237/091-2227074** මගින් විමසිය හැකිය.

එම්.බී.චන්ද්‍රනිමල්
සභාපති
ද.ප.මා.ම.ප්‍රවාහන අධිකාරිය
ගාල්ල.
**2026/07/31**